


# මරණ සති භාවනාව

ප්‍රධාන භාවනාවට පෙර සිදු කැරෙන චතුරාරක්ඛ භාවනාවේ පළමුවැන්න වූ බුදුගුණ භාවනාවේත්, දෙවැන්න වූ මෛත්‍රී භාවනාවේත් තෙවැන්න වූ පිළිකුල් භාවනාවේත් යෙදුණු මට පියවරෙන් පියවර ගැඹුරු ශාන්ත ස්වභාවයට මගේ සිත පත් වනු දැනිණ. පිළිකුල් භාවනාව නිසා ශරීරය පිළිබඳ ව ඇති ආශාව, ඇලීම, රාගය දුරු ව, එහි අනිත්‍ය ස්වභාවය ද සිතට මුසු විය.

යම් දිනෙක මේ ශරීරය මුළුමනින්ම විනාශයට පත් වෙයි. ඒ අවස්ථාව මරණය යි.

මම චතුරාරක්ඛ භාවනාවේ සිව්වැන්න වූ මරණ සති භාවනාවේ යෙදෙමි. දෑස තදින් පියවිණ.

මරණය නියතයි. ජීවිතය අනියතයි.

මරණය නියතයි. ජීවිතය අනියතයි.

මරණය නියතයි. ජීවිතය අනියතයි.

මරණය නියතයි. ස්ථිර ව ම, නිසැක ව ම මගේ මරණය සිදු වෙනවා. මා දැන් භාවනාවේ යෙදෙන මේ කුටිය තුළ මේ කොට්ටය මත මගේ මරණය මේ මොහොතේ ම සිදු විය හැකි යි. හිසේ නහරයක් පුපුරා හෝ හදවතේ නහරයක් පුපුරා හෝ මේ මොහොතේ ම මගේ මරණය සිදු විය හැකි යි. මා භාවනාව අවසන් කොට නැඟිට පිටතට යන විට පඩිපෙළෙන් වැටී හිස ගල් පඩියක වැදී මගේ මරණය සිදු විය හැකියි. මා මුහුණ සෝදන්නට පොකුණ ළඟට යන විට ගලක් මත ලිස්සා ගොස් වැටී මා මරණයට පත් විය හැකි යි. මා වතුර අඳින විට පොකුණට වැටී දියෙහි ගිලී මගේ මරණය සිදු විය හැකි යි. වැසිකිළියේ ලිස්සා ගොස් වැටී මරණය සිදු විය හැකි යි. රාත්‍රියේ මාළුවේ ඇවිදින විට තණකොළ පඳුරු අතර සිටින සර්පයෙකු දෂ්ට කොට මා මරණයට පත් විය හැකි යි.

මා සමඟ අමනාප අය ද ඉන්නවා. සමහර විට ඔවුන් මගේ ආහාරයට වස මුසු කොට මා මරා දැ සමහර විට ඔවුන් මගේ ආහාරයට වස මුසු කොට මා මරා දැමිය හැකියි. පිහියෙන් ඇන, තුවක්කුවෙන් වෙඩි තබා, බෝම්බ ගසා මා මරණයට පත් කළ හැකි යි.

පාරේ ගමන් කරන විට වාහනයකට යට වී හෝ මා මරණයට පත් විය හැකියි.

රෝගයකට ගොදුරු වී දීර්ඝ කාලයක් පණු වන් පිරුණු ශරීරයෙන් යුතු ව අනන්ත දුක් විඳිමින් උඩුකුරු ව ඇඳක සිට මා මරණයට පත් වීමට ද ඉඩ තිබෙනවා.

කෙසේ හෝ කවදා හෝ මගේ මරණය ඒකාන්ත වශයෙන් ම සිදු වෙනවා. එය ස්ථිරයි. නියතයි. මරණය නියත යි. ජීවිතය අනියතයි.

ලොව දිනූ, සසර දිනූ ලොවුතුරා බුදු පියාණන් වහන්සේටත් මරණය උරුම වුණා. සක්විති රජවරුන්, මහ රජවරුන්, ජනාධිපතිවරුන් පවා මේ මරණයට ගොදුරු වෙනවා. ලොකු කුඩා වෙනසක් නැතිව දුප්පත් පෝසත් භේදයක් නැතිව මේ මරණය සියලු සත්වයාටම උරුම වෙනවා.

මරණය නියතයි. ජීවිතය අනියතයි.

මේ මරණයත් සමඟ මා ඇලීමෙන්, බැඳීමෙන්, ආසාවෙන් බදාගෙන සිටි සියලු දෙයින් ම මා මිදෙනවා. මට ඒ සියල්ල, මගේ නෑදෑයන්, මිතුරන්, පොත පත, ඉඩම්, ගෙවල් මේ සියල්ල මට නැතිවෙනවා. ශරීරය නිකම් අප්‍රාණික දඬුකදක් බවට පත් වෙනවා.

සියලු දේ මේ මරණයත් සමඟ අත්හරින්නට සිදු වෙනවා.

මේ අත්හැරීමට මා මරණයට පත් වන තුරු ඉන්නේ නැහැ. ඊට පෙර, මරණය සිදු වීමට පෙර, මම මේ මොහොතේ ම මා ඇලී බැඳී සිටි සියලු දේ අත්හරිනවා.

සියලු දේ සිතින් අත්හරිනවා.
අත්හරිනවා අත්හරිනවා.
අත්හරිනවා අත්හරිනවා.
මම දිගින් දිගට ම අත්හැරීම පිළිබඳ ව සිතමි.

දැන් මට ඇත්තේ සියලු දේ අත්හළ අතිශාන්ත සිතක්... සුවදායක සිතක්... සැහැල්ලු සුන්දර සිතක්.... කිසිවකට නො ඇලුණු, රමණීය සිතක්....

10 වන පිටෙන්

ඉදිරිපත් කරන්නේ.

විශේෂයෙන්ම මේ පවුල සඳහා ඇයි සමෘද්ධි සහනාධාරය නොලැබුණේ කියන කාරණය පිළිබඳව වගේම, මේ දරුවන්ගේ පියාට යම් මානසික රෝගයක් තියේද යන්න පිළිබඳවත් වෙනම වාර්තාවක් කැඳවීමට කටයුතු කරනවා. එසේ මානසික රෝගයක් තියේ නම් දරුවන්ගේ ආරක්ෂාව සම්බන්ධයෙන් ගතයුතු ක්‍රියාමාර්ග පිළිබඳවත් මා විශේෂ අවධානයක් යොමු කරනවා. මීට අමතරව මෙම වාර්තාව අවසානයේදි යම් නිලධාරියෙකු තම රාජකාරිය පැහැර හැර තියෙනවා නම් අපි ඒ සම්බන්ධයෙන් එම නිලධාරියාගෙන් නිදහසට කරුණු විමසීමක් කරනවා. එය සෑහීමකට පත්විය හැකි පිළිතුරක් විය යුතුයි. විශේෂයෙන්ම මම දැක්කා ඒ මව කියනවා මට ත්‍රිපෝෂ ගන්න එන්න කියලා පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිණිය කිව්වා. නමුත් මට යන්න බැරි වුණා කියලා කියනවා. ඒ අනුව මා සොයා බලනවා ඇයි ඒ මවට ත්‍රිපෝෂ ගන්න යන්න බැරි වුණේ කියලා. ඒ මවට යන්න බැරි වුණේ සාධාරණ හේතුවක් නිසා නම් ඇයි පවුල් සෞඛ්‍ය සේවිකාවට එම ගෙදරට ත්‍රිපෝෂ පැකට් දෙක ගෙනිහින් දෙන්න බැරි වුණේ කියලත් මම විමසීමක් කරනවා. මොකද දැන් ඒ අයට රජයෙන් යතුරුපැදි පවා ලබා දීලා තියෙන්නේ. ඇයි පවුල් සෞඛ්‍ය සේවිකාවට ඒ ගෙදරට ත්‍රිපෝෂ පැකට් දෙක ගෙනිහින් දෙන්න බැරි වුණේ කියන කරුණ කෙරෙහිත් මා විමසීමක් කරනවා. මීට අමතරව පවුල් සෞඛ්‍ය සේවිකාව මේ පවුල පිළිබඳව සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලයට වාර්තා කර තිබුණේද, ඒ අනුව සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී මේ පිළිබඳව අදාළ අංශ දැනුවත් කර තිබුණේද යන්න පිළිබඳවත් මා විමසීමක් කරනවා. මොකද මේ වන විට මා වෙත තිස්සමහාරාම සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලය මගින් එවන ලද ලිපියක මෙලෙස සඳහන් වෙනවා. මරණ පරීක්ෂණ වාර්තාව අනුව එම දරුවා මිය යෑමට හේතුව මන්ද පෝෂණ තත්ත්වය බව සඳහන් කර ඇත. මෙම මරණය සම්බන්ධයෙන් විමර්ශන කටයුතු සිදුකරමින් පවතින අතර එම දරුවා දින කිහිපයක්ම නිරාහාරව සිට ඇති බවද අනාවරණය විය. මේ ලිපිය මා වෙත එවලා තියෙන්නේ තිස්සමහාරාම සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී වරයායි. මට ලැබුණු මේ ලිපිය අනුව තමයි මා ප්‍රකාශ කළේ මේ විදියට ළමයි මිය යන්න බැහැයි කියලා. මේක මහා වරදක් කියලා මන් කිව්වේ ඒ නිසයි. සමස්ත රාජ්‍යයාන්ත්‍රණය තුළ ගම්මට්ටමේ සිටින සියලූම නිලධාරීන් මේ තත්ත්වයට වගකිව යුතුයි කියන එකයි මගේ මතය වන්නේ. යම් නිලධාරියෙක් මෙහිදී වගකීම් පැහැර හැර තියේ නම් ඒ පිළිබඳව මම දැඩි ලෙස ක්‍රියා කරනවා.

මේ වන විට එම ප්‍රදේශයට ගිය මගේ නිලධාරීන් මට වාර්තා කරලා තියෙනවා මියගිය දරුවාගේ පියා යම් යම් ආධාර ප්‍රතික්ෂේප කරලා තියෙනවා කියලා. එහෙමයි කියලා රජයේ නිලධාරීන්ට මේ සිදුවීමෙන් කර අරින්න පුළුවන් කමක් නෑ. මොකද මානසික ආතතියක් තියෙන කෙනෙක් සම්බන්ධයෙන් රාජ්‍යනිලධාරීන්ට කටයුතු කළ යුතු ආකාරයක් තියෙනවා. පහළ නිලධාරීන්ගේ වගකීම තමයි මේ සම්බන්ධයෙන් ඉහළ නිලධාරීන් දැනුවත් කිරීම. එසේ නොකිරීමම වරදක් වෙනවා. මොකද මේ සිදුවීම වෙලා මාසයක් ගියාම තමයි මමත් මේ ගැන දැනගන්නේ. ඒ නිසා මේ සිදුවීමේදී නිලධාරීන් පිළිබඳව වෙනමත් එම පවුල පිළිබඳව වෙන වෙනමත් සොයා බලා අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නා බවයි දිස්ත්‍රික් ලේකම් වරයා පැවසුවේ.

මෙම දරුවාගේ මිය යෑම සම්බන්ධයෙන් පවුල් සෞඛ්‍ය සේවිකාව අතින් කිසිදු වරදක් සිදුව නැති බවත් පවුල් සෞඛ්‍ය සේවිකාව සිය රාජකාරිය නිසි පරිදි ඉටුකර ඇති බවත් හම්බන්තොට දිස්ත්‍රික් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂිකා වෛද්‍ය දීපිකා පටබැඳිගේ මහත්මිය පවසයි. මෙම දරුවාගේ මරණයට හේතුව එම දෙමාපියන් දරුවා කෙරෙහි දැක් වූ අඩු සැලකිල්ල බවයි ඇය පවසන්නේ.

පවුල් සෞඛ්‍ය සේවිකාව නිරන්තරයෙන්ම මේ නිවසට ගොස් මේ දරුවන් පිළිබඳව සොයා බලා දරුවාගේ බර කිරා ත්‍රිපෝෂ ලබා දීමට පවා නිර්දේශ කරලා තියෙනවා. නමුත් එම දෙමාපියන් සායන සඳහා පැමිණ තියෙන්නෙත් එක් දිනයකදී පමණයි. එහෙම තියෙද්දිත් පවුල් සෞඛ්‍ය සේවිකාව නිතරම එම නිවසට ගොස් සොයා බැලීම කරලා තියෙනවා. හම්බන්තොට කියන්නේ ලංකාවේ ළදරු පෝෂණ මට්ටම අතින් දෙවැනි තැන අරගෙන තියෙන දිස්ත්‍රික්කයක්. ඒ නිසා මන්දපෝෂණයෙන් දරුවෙකු මැරෙන්න තරම් අගහිඟකම් තියෙන්න විදියක් නෑ. එහෙම වෙනවා නම් එය දෙමාපියන්ගේ නොසැලකිල්ල නිසාමයි වෙන්න පුළුවන් යැයි ද ඇය පැවසුවාය.


දිස්ත්‍රික් ලේකම් [illegible]

කෙසේ නමුත් මේ වන විට මන්දපෝෂණ තත්ත්වයක් හේතුවෙන් හම්බන්තොට දිස්ත්‍රික්කය තුළ දරුවෙකු මියගොස් ඇති බව අප කවුරුත් දන්නා සත්‍යකි. ඒ හේතුව නිසා රාජකාරිය නියමිත පරිදි ඉටුකළ නිලධාරීන් පවා මේ වන විට දෝෂදර්ශණයට ලක්ව තිබේ. ගම් මට්ටමේ සිටින නිලධාරීන්ගේ පටන් මරණ පරීක්ෂණය පැවැත්වූ වෛද්‍යවරයා දක්වාම ඇතැම් පිරිස් ඇඟිල්ල දිගු කරමින් සිටීම කොතරම් දුරකට සාධාරණද යන්නත් අප සිතා බැලිය යුතුව ඇත. කොතනින් හෝ එක් තැනකින් දෝෂයක් වී ඇති බව සත්‍යකි. එක මකුනෙක් කෑ පළියට සියලූ මකුනන් මරා දැමීම සාධාරණ නැතිය. මේවන විට මේ සිදුවීමත් සමග රාජකාරියේ නිරතවූ එම ප්‍රදේශයේ රාජ්‍යනිලධාරීන් සම්බන්ධයෙන්ද විවිධ වූ කට කතා පැතිර යයි. ඒ අතරට ඇතැම් නිලධාරීන්ගේ වැඩ තහනමට ලක් කර ඇති බවද වාර්තා වුවත් එවැන්නක් පිළිබඳව තවමත් නිසි ප්‍රකාශයක් වගකිවයුතු පාර්ශ්ව ප්‍රකාශ කර නොමැතිය. එම නිලධාරීන් සම්බන්ධයෙන් වහාම පරීක්ෂණයක් සිදු කරන ලෙස උපදෙස් ලැබී ඇති බව නම් සත්‍යය. එනිසා සාධාරණ පරීක්ෂණයකින් පසු වරදක් සිදුව ඇති පුද්ගලයන් සොයා ඔවුන්ට දඬුවම් පැමිණවීම සිදුවිය යුතුය. එමෙන්ම මේ සිදුවීම පාදක කරගෙන ඇතැම් අය සිය පටු අරමුණු ඉටු කරගැනීමට උත්සාහ දරන බවද පෙනී යයි. එයද අනුමත කළ නොහැකි කරුණක් බව සිහිපත් කරන්නෙමු. මින් ඉදිරියට ශ්‍රී ලංකාව තුළ කුසගින්නේ සිටීම නිසා මරණයක් සිදු නොවන්නට අප සැවොම එක්ව කටයුතු කිරීම වැදගත් බවද සිහිපත් කරන්නෙමු. එමෙන්ම මෙහිලා සඳහන් කළ යුතු තවත් කරුණක් වෙයි. ඒ මේ මරණය සම්බන්ධයෙන් වූ පශ්චාත් මරණ පරීක්ෂණය පැවැත්වූ වෛද්‍ය වරයා සම්බන්ධවයි. ප්‍රදේශයේ සියලූ ජනතාව පවසන්නේ ඇත්ත ඇති සැටියෙන් එම වෛද්‍යවරයා සිය වාර්තාව ඉදිරිපත් කිරීම තුළ රට තුළ ඒ පිළිබඳව කතා බහක් ඇති වූ බවත් නිදා සිටි ගම් මට්ටමේ නිලධාරීන්ගේ ඇස් ඇරීමට තරම් මෙම වාර්තාව පිටිවහලක් වූ බවත්ය.